“අනුමානය (සැකය) ගැන ඔබ ප්රවේසම් විය යුතුයි. සැබැවින්ම අනුමානය කතාවෙන් වඩාත් ව්යාජය

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. “අනුමානය (සැකය) ගැන ඔබ ප්රවේසම් විය
යුතුයි. සැබැවින්ම අනුමානය කතාවෙන් වඩාත් ව්යාජය. ඔබ රහස්ය දෑට සවන් නො දෙන්න.
විපරම් නො කරන්න. එකිනෙකාට ඊර්ෂ්යා නො කරන්න. එකිනෙකාට පිටුපාමින් කටයුතු නො
කරන්න. එකිනෙකාට කේරා්ධයෙන් කටයුතු නො කරන්න. ඔබ සැම අල්ලාග්ගේ ගැත්තන් ලෙස සහෝදරයින් සේ සිටින්න" [صحيح] [متفق عليه]

මුස්ලිම්වරුන් අතර භේදයට හා සතුරුකමට තුඩු දෙන සමහර දේවල් නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාණන් තහනම් කර ඒවා ගැන අනතුරු අඟවා ඇත. ඒවා අතරින්: (සැකය / අනුමානය) යනු කිසිදු සාක්ෂියකින් තොරව හදවතේ ඇති චෝදනාවක් වන අතර එය කතාවෙන් ඉතාමත්ම සාවද්ය එකක් බව පැහැදිලිය. 'තහස්සුස්' හෙවත් රහස් සෙවීමෙන්' යනු මිනිසුන්ගේ රහසිගත දෑ ඇසින් හා කනින් සොයා යෑමය. 'තජස්සුස්' හෙවත් විපරම් කිරීම යනු සැඟවුණු කටයුතු ගැන සොයා බැලීම ය. බොහෝ විට නපුර පිළිබඳ එහිදී පවසනු ලැබේ. 'හසද්' හෙවත් ඊර්ෂියාව යනු වෙනත් අයවලුන්හට ආශිර්වාද හිමි වීම ගැන වූ අකමැත්තය. 'තදාබුර්' හෙවත් කෙනෙකු අනෙකා පිටුපෑම. ඒ අනුව ඔහු තම සහෝදරයාට සලාම් නොපවසයි. ඔහුගේ සුවදුක් නොවිමසයි. 'තබාගුල්' හෙවත් පිළිකුල් කිරීම සහ විරසක වීම, එනම් අන් අයට හානි කිරීම, මුහුණ අප්රසන්න කර ගැනීම සහ නරක හැසිරීම. පසුව එතුමාණෝ "නුඹලා අල්ලාග්ගේ ගැත්තන් ලෙස සහෝදරයින් සේ සිටිනු" යැයි මුස්ලිම්වරුන්ගේ තත්ත්වයන් එකිනෙක සමාදාන කරන පුළුල් වචනයක් කීවේය. සහෝදරත්වය යනු මිනිසුන් අතර සබඳතා ශක්තිමත් කරන අතර ඔවුන් අතර ආදරය හා ඇසුර වැඩි කරන බැඳීමකි.

http://sunnah.global/hadeeth/si/show/5332